# අනුරාධපුර, පුවරසන්කුලම ඓතිහාසික චෛතියගිරි විහාරය පිළිබඳ අධ්‍යයනයක්

පි.එන්.එම්. සමරතුංග
දෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
*Niroshasamarathunga933@gmail.com*

## හැඳින්වීම

ජනප්‍රවාදගත සාධකවලට අනුව දෙවන පෑතිස් රජු දවස (ක්‍රි.පු 250-210) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩමවන අවස්ථාවේ දී සඟමිත් තෙරණිය ඇතුළු පිරිවර පුවරසංකුලම ගම ඔස්සේ අනුරාධපුරයට සැපත් වූ බව සඳහන් වේ. (හෙට්ටිආරච්චි, සමරනායක 2013:4) එසේම භාතිකාභය රජු කල (ක්‍රි.ව 22-7) අනුරාධපුර මහාථූපයේ පූජාවන් සඳහා මිනිසුන් පුල්එළිය ගමින් මල් නෙලා, පුනෑවෙන් මල් ධෝවනය කර, තුලාවෙල්ලියෙන් මල් කිරා, පුවරසන්කුලම හරහා අනුරාධපුරයට ලඟා වූ බව ද ජනප්‍රවාද කථාවල කියවේ. (හෙට්ටිආරච්චි, සමරනායක,2013:4). පුවරසන්කුලම රජමහා විහාරය වර්තමානයේ චෛතියගිරි විහාරය ලෙස හඳුන්වනු ලැබේ. මෙම විහාරය හැඳින් වූ පැරණි නාමය කුමක්දැයි පැහැදිලි නැත."චෛතියගිරි" යන නාමය පටබැඳි ඇත්තේ පර්වත මත පිහිටි නටබුන් දාගැබ පදනම් කරගෙන ය. "පුවරසන්කුලම"යන ග්‍රාම නාමය ද්‍රවිඩ යෙදුමකි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙම ප්‍රදේශවල මිනුම් කටයුතු කල ද්‍රවිඩ නිලධාරි මහතුන් විසින් නමක් නැති ගම් උදෙසා වැව මුල්කොට යම් යම් ග්‍රාම නාම යොදන ලදි. ඒ අනුව "මල් සහිත වැව"යන අරුතින් හෝ "ගම්සුරිය ගස් සහිත වැව"යන අරුතින් මෙම නම භාවිත කල බව පෙනී යයි.

## ක්ෂේත්‍රයේ පිහිටීම

අනුරාධපුර පූජා නගරයට කිලෝමීටර් 8ක් පමණ උතුරු දෙසින් ග්‍රාමීය පරිසරයක පිහිටා ඇති පුවරසන්කුලම චෛතියගිරි රජමහා විහාරය මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අංක 310 පුවරසන්කුලම ග්‍රාම නිලධාරි වසමට අයත් වේ. උතුරු අක්ෂාංශ $08^0$ 26.679 හා නැගෙනහිර දේශාංශ $080^0$ 23.956 වන සේ ගෝලීය පිහිටීමකින් යුක්ත මෙම ස්ථානය අනුරාධපුර නගරයේ සිට යාපනය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ යාපනය මංසන්ධියෙන් ඉදිරියට කි.මී 2ක් පමණ ගමන් කළ විට උත්තර සාලියපුර විහාරස්ථානය අසලින් වමට ඇති සාලියපුර දුම්රිය ස්ථානයට පිවිසෙන මාර්ගයේ කි.මී 8ක් පමණ ගමන් කොට එතැන් සිට


පුවරසන්කුලම වැව් බැම්ම මතින් කි.මී 1ක් පමණ ගමන් කිරීමෙන් චේතියගිරි විහාරයට ළඟා විය හැකි ය.

## ක්‍රමවේදය

පුවරසන්කුලම චේතියගිරි විහාරය පිළිබඳ ව අධ්‍යයනයේ දී මූලික ලෙස ක්ෂේත්‍ර ගවේෂණය සිදු කල අතර ඒ යටතේ සෘජු නිරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබා ගන්නා ලදි. එසේම පුස්තකාල පරිශිලන තුළින් කරුණු ඒකරාශි කරගෙන මෙම ලිපියට ගොනු කරන ලදී.

පුරවසන්කුලම වැවට යාබද ව පැතිරුණු ගල් තලාව මත නිර්මාණය කරන ලද මෙම විහාරස්ථානය අක්කර 6ක පමණ භූමි භාගයක් පුරා විහිදේ. අතීතයේ ඉදිකළ ශිලා ලේඛන, නටබුන් ස්තූපය, පොහොයගෙය, බුදු පිළිම, පිළිම පාදම්, ආසන, සිරිපතුල් ගල් ආදි බෞද්ධ නටබුන් රාශියක් විහාර භූමියේ තැන තැන විසිර පවතිනු දැකගත හැකි ය.


මෙම විහාර පරිශ්‍රයේ පොහොයගෙය යැයි හඳුනාගන්නා ගල් කණු 48 කින් යුතු ගොඩනැගිල්ලේහි ගල් කණු දෙකක ඇති ශිලා ලේඛන මෙම විහාරයේ ඉතිහාසය හැදෑරීමට බෙහෙවින් උපකාරි වේ. මීටර් 3ක් උස හා සෙන්ටිමීටර් 70ක් පමණ පළල සතරැස් ගල් කුලුණුවලින් එකක් යට සිට උඩට දික් අතට **සි රක‍ඩ සබ ටබි** යනුවෙන් සටහන් කොට ඇත. එහි අර්ථය වන්නේ "යහපතක් වේවා! සබ රජගේ කුලුන " යන්න ය. දෙ වැනි ලිපිය මුල් ලිපිය මෙන් ම ගල් කණුවේ යට සිට ඉහළට දික් අතට අක්ෂර පේළියක් වේ. එහි පෙළ වන්නේ **"සි නකවුළ බිය ටබි "** යනුවෙනි. එනම් "යහපතක් වේවා! නාගචූලා කුමරියගේ ස්ථම්භය" යනුවෙනි (හෙට්ටිආරච්චි, සමරනායක, 2013-17). මෙහි පළමු වැනි ලිපියේ සඳහන් සබ රජ යනු ක්‍රි.ව 60-70 අතර ලංකාවේ රජ කළ සබ රජු ලෙස සැලකීමට පුළුවන. ඔහු යසලාලක තිස්ස රජු කුමන්ත්‍රණකාරි ලෙස මරණයට පත් කර බලය ලබාගත් අයෙකි (මව.35:,25,56). පුවරසන්කුලම විහාරයේ ද පෙහොයගෙය සැකසීමට සබ රජු දායකත්වයක් සපයන ලද බවට සෙල්ලිපියෙන් පැහැදිලි ය. එහෙත් එය වංස කථාවේ සඳහන් ව නැත. මෙහි ඇති අනෙක් සෙල්ලිපියේ එන නාගචූලා කුමරිය කවරෙක්දැයි පැහැදිලි නැත. බොහෝ විට ඇය සබ රජුගේ බිසව වීමට ඉඩ ඇත. මෙම ශිලා ලේඛන පිළිබඳ ව පළමුවෙන් ම වාර්තා කර ඇත්තේ එච්.සී.පී. බෙල් මහතාය (හෙට්ටිආරච්චි, සමරනායක 2013:18). 1892 ඔහු මේවා පිටපත් කර ඇතත් කියවා ප්‍රකාශයට පත්කර නැත. ඉන්පසු නැවත ආචාර්ය මාලනී ඩයස් මහත්මිය ද මෙම ලිපි කියවා ඇතත් එහි අදහස් දක්වා ඇත්තේ වෙනස් අයුරිනි. එතුමියට අනුව **(චිත) පුසබි ටබි** යනුවෙන් හා **ලකන කඩ බිය ටබි** යනුවෙනි. පළමු වැනි පෙළ තුළින් **චිත පුස නම් බිසවගේ** ටැඹ ලෙසත් දෙ වැනි පෙළට **ලකණ කඩ නම් බිසවගේ** ටැඹ යන අරුත් සපයා ඇත (Dias 1991 :88). මෙම කියවීම් දෝස සහිත බව හෙට්ටිආරච්චි මහතා අදහස් දක්වයි.



ශිලා ලේඛන සහිත ස්තම්භ (ඡායාරූප-1)

සැලකිය යුතු තරමින් විනාශ භාවයට පත් දාගැබ අද ඉලුක්, මානා වැනි තෘණ පඳුරු හා විශාල ගස් වැවී පස් කන්දක් මෙන් දිස් වේ. ස්තූපය ස්වභාවික පාෂාණ උද්ගතයක් මත ඉදිකර ඇත. ගල් තලාව මත ගඩොල් උපයෝගි කරගෙන චතුරස්‍රාකාර කෙටි පාදමක් ගොඩනංවා ඒ මත ස්තූපය ඉදිකිරීම සිදුකර තිබේ. මේ ආකාරයට ස්වභාවික පාෂාණය උපයෝගි කරගෙන නිර්මාණය කර ඇති ස්තූප ලෙස අන්දරවැව, වෙහෙරගල, කිරලාගල, හඳගල, ආඬිගල, ආදි ස්ථාන ආශ්‍රිත ව ඇති ස්තූප පෙන්වාදිය හැකි ය. ස්තූපයේ දකුණු දෙස ස්තූප මළුවට පිවිසීම සඳහා වූ ගල් පඩි පෙළ පිහිටි පොළවේ සිට අඩි 10ක් පමණ උසට විහිදී ඇත. එබැවින් ඒ දක්වා ස්තූප පාදම නිර්මාණය වූ බව පැහැදිලි ය. ස්තූපයේ සෑම තැනම විවිධ ප්‍රමාණයේ ගඩොල් සහ ගල් කැබලි දැකිය හැකි ය. දළ වශයෙන් ගඩොලක දිග,පළල, හා ඝනකම පිළිවෙලින් සෙ.මී. 28×22×8ක් වේ. මීටර් 6ක් පමණ උස්වන මෙම ගරා වැටුණු ස්තූපයේ වට ප්‍රමාණය මීටර් 110ක් පමණ වේ. දාගැබ විනාශ වී තිබෙන ආකාරය අනුව එහි පේසා වළලු කිහිපයක් දක්නට තිබේ. ස්තූප ගර්භයට ඉහළින් වූ කොටස් කවරාකාරයකින් තිබුණේ ද යන්න පිළිබඳ ව අදහසක් ඇති කර ගත නොහැකි ය . එසේ වුවත් පැරණි දාගැබ්වල උපරි භාගයේ තැන්පත් කොට තිබූ යූප ගලක කොටස් හමු වී ඇත. යූප ගල හෙවත් යූපස්තම්භය අනුරාධපුර මුල් සමයේ දාගැබ්වල ගර්භය මත පිහිටුවා තිබූ පූජා අංගයකි (හෙට්ටිආරච්චි,සමරනායක 2013:23). මේවායේ පහළ අර්ධය සතරැස් වන අතර ඉහළ අර්ධය අටපට්ටම් වේ. පුවරසම්කුලම යූප ගලෙහි අටපට්ටම් ඉහළ කොටස දාගැබ් මළුවේ වැටී තිබී පසුව පොහොය ගෙය අසල තැන්පත් කොට ඇත. එහි දිග මීටර 1.85කි. අටපට්ටම් මුහුණතේ පළල සෙ.මී. 13කි. අනුරාධපුරයේ යූප ගල් යොදා තිබූ ස්තූපයන් ලෙස මිරිසවැටිය, අභයගිරිය, මිහින්තලය ආදී දාගැබ් උදාහරණ වේ (හෙට්ටිආරච්චි, සමරනායක 2013:23). දාගැබ වෙත ප්‍රවේශ වීමට ප්‍රධාන දොරටු උතුරු හා දකුණු දිශාවෙන් පිහිටුවා ඇත. දකුණු දිශාව හා සම්බන්ධ ගල් පඩි පෙළක සාධක පැහැදිලි ව දැකගත හැකි ය. මීටර් 6ක් පමණ දිගින් යුත් ගල් පඩියක උස සෙ.මී. 20ක් ද පළල සෙ.මී. 28 වේ. එසේ නටබුන් වූ ගල් 22ක් පමණ දැනට දැකිය හැකි ය. පිහිටි පාෂාණය මත ස්තූපය ගොඩනංවා ඇති නිසාවෙන් පිහිටි පොළවේ සිට ස්තූප මළුව දක්වා

ගමන් මාර්ගය මෙසේ ගල් පඩි යොදා නිමකර ඇති බව පෙනේ.



යූප ගල (ඡායාරූප-2)


ගොඩනැගිල්ලක් ලෙස නිර්මාණය කර තිබුණු බව සිට වූ ගල් කණුවල අග ඇති ලී දඬු රැඳවීමට කපන ලද කත්තු ලක්ෂණ මඟින් නිගමනය කර ඇත. උසින් මීටර් 3ක් ද පළලින් සෙ.මී.70 පමණ වූ ද මෙම ගල් කුලුණු දැඩි බවින් හා රළු බවින් යුක්ත ය. දැනට වල්බිහිව ඇති මෙම ගොඩනැගිල්ලේ ගල් කණු දෙකක මතුපිට ශිලා ලේඛන දෙකක් දැක ගත හැකි ය. මේ හැර තවත් කුළුණු දෙකක ජ්‍යාමිතික හැඩයක් සහ ඊතලයකට සමාන රූපයක් දක්නට ලැබේ. මේවා මෙම ගල් කුළුණු සැකසීමට දායකත්වය සපයන පුද්ගලයින්ගේ හෝ ගෝත්‍ර සංකේත විය හැකි බව හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කර ඇත (හෙට්ටිආරච්චි 2013: 26). ලෝවාමහා ප්‍රාසාද පොහොය ගෙය, රත්නප්‍රාසාද මෙන්ම සිතුල්පව්ව ආදි පැරණි සෑම විහාරයකම පාහේ මෙබඳු පොහොය ගෙවල් සාධක හමු වී ඇත. පුවරසන්කුලම පෙහොයගෙය ශිලා ලේඛන සාධක අනුව ක්‍රි.ව. 1 වැනි සියවස නියෝජනය කරන අතර සමකාලීන වශයෙන් මෙය විශාල ඉදිකිරීමක් බව නටබුන් තුළින් සාධක සැපයිය හැකි ය.



පොහොය ගෙය (ඡායා රූප-3)

ස්ඵටික හුණුගල්වලින් නිර්මාණය කරන ලද සිරිපතුල් ගලක් ද මෙම ස්ථානයෙන් හඳුනාගත හැකි ය. දිගින් හා පළලින් සෙ.මී.75×70×40ක් උසකින් යුතු පීඨයකින් ද මෙය යුක්ත වේ. පීඨයේ ඉහළ පහළ කොටස් බොරදම් සහිත ව අලංකාරව හැඩ ගන්වා ඇත. සිරිපතුලේ ඇඟිලි සමාන දිගින් හා පළලින් කැටයම් කර තිබේ. දැනට අක්‍රමවත් ලෙස විහාර භූමියේ තැන්පත් කර ඇති මෙම සිරිපතුල පෙර දවස ස්තූපයේ සතර දිශාවෙන් තැන්පත් කර තිබෙන්නට ඇති බව සිතිය හැකි ය. මෙම කලාපයේ අනෙකුත් ස්තූප අධ්‍යයනයෙන් එය පැහැදිලි ය. මෙවැනි කලා ලක්ෂණවලින් යුත් සිරිපතුල් ගල් අඹගස්වැව, හඳගල හා නාවාගල ආදී පුරාවිද්‍යා ස්ථානවලින් ද හමු වී තිබේ. බුදුන් වහන්සේගේ මානව රූපකාය නිර්මාණය කිරීමට පෙර බැතිමත්හු සංකේත භාවිත කළ අතර ලාංකීය කලාකරුවන් මෙම සංකේත අතුරින් වඩා බහුල ලෙස සිරිපතුල් ගල් හා

ආසන භාවිතා කල බවට මෙම පුරාවිද්‍යා ස්ථාන සාධක සපයයි.



සිරිපතුල් ගල (ඡායාරූප-4)



හිදි බුද්ධ ප්‍රතිමා වහන්සේ (ඡායාරූප-5)

පුවරසන්කලම විහාර භූමියෙහි දැනට විනාශ වී ගිය බුදු පිළිම සාධක දැකගත හැකි ය. මෙයින් දෙකක් හිදි පිළිම ගණයට අයත්වන අතර එකක් හිටි පිළිම ගණයට අයත් වේ. මෙම භූමියේ තැන්පත් ව තිබූ ගලින් නිම කරන ලද හිදි බුදු පිළිම දෙකක් අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. ස්තූපයට බටහිර දෙසින් ඇති ගල් පර්වතයක් මත සමාධි මුද්‍රාවෙන් නිර්මාණය කරන ලද ප්‍රතිමාවක් දැකගත හැකි ය. හිස සුන් වූ සමාධි ප්‍රතිමාව සෙ.මී. 96 උසය. මෙම පිළිමයේ චීවරය ඒකාංශ ව පොරවා තිබේ. වම් අත්ල මත දකුණු අත්ල තබා පිහිටුවීමෙන් සමාධි මුද්‍රාව නිරූපනය කරයි. එසේ ම වම් පාදය මත දකුණු පාදය පිහිටුවීමෙන් වීරාසනය ප්‍රකට කරයි. පිළිම වහන්සේ හිදුවා ඇත්තේ අගල් 6ක් පමණ ඝණකමින් යුතු එලකයක් මත ය. අනුරාධපුර යුගයේ හිදි පිළිම සඳහා භාවිතා කරන ලද පොදු සම්ප්‍රදායට මෙම පිළිමය නිර්මාණය කර ඇත. 1895 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම පිළිමය වාර්තා කළ බවට තොරතුරු ලැබී ඇත (හෙට්ටිආරච්චි 2013:33).

යටිකය පමණක් දැකිය හැකි මෙම සමාධි පිළිමයක් ද මෙම පුරාවිද්‍යා භූමියෙන් දැක ගත හැකි ය. එය නටබුන් වූ පෙහොයගෙය තුළ දැනට තැන්පත් කර ඇත. පිළිමයේ දෙදණ අතර පරතරය සෙ.මී. 98කි. මෙහි ද සමාධි මුද්‍රාවත්, වීරාසනයත් දැකගත හැකි ය. මෙම පිළිමය ද එලකයක් මත නිර්මාණය කර ඇත. විනාශයට පත් ව ඇති මෙම පිළිම වහන්සේ අදටත් පාරිසරික තත්වයන්ගෙන් පීඩා විඳිමින් එම ස්ථානයේ ම තිබෙනු දැකගත හැකි ය.

මෙම පරිශ්‍රයෙන් හමුවන වැදගත් ප්‍රතිමාවක් ලෙස හිටි පිළිමය පෙන්වාදීමට පුළුවන. හිස, දෙඅත්, දෙපා, හා සිරුරේ ඇතැම් කොටස් දැඩි හානියකට පත් ව ඇත. පිළිමයේ දැනට ඉතිරි වී ඇති කොටසේ උස සෙ.මී.105කි. දකුණු අත දකුණු උරහිස් සහිතව ම විනාශ වී ගොස් ඇති බැවින් ප්‍රතිමාවේ මුද්‍රාව පිළිබඳ ව තේරුම් ගත නොහැකි ය. වම් අත වැලමිට ලඟින් නමා ඉහළට ඔසවා තිබූ බවට සුළු සාධක ඉතිරි ව ඇත. ඒ අනුව කටක හස්ත මුද්‍රාවෙන් මෙම

හිටි පිළිමය ද නිර්මාණය කර තිබෙන්නට ඇති බව සිතිය හැකි ය.



හිටි බුදු පිළිම වහන්සේ (ඡායාරූප- 6)

අනුරාධපුර මහාවිහාර සීමාවෙන් පිටත පිහිටා ඇති එහෙත් එම සීමාවේ ඇති විහාරස්ථාන තරම් සාධක පවතින නගරයට උතුරින් පිහිටි පුවරසන්කුලම විහාර පරිශ්‍රයේ නටබුන් ව පවත්නා විවිධ පැරණි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් අංග මෙන්ම බුද්ධ ප්‍රතිමා වැනි කලාත්මක ගුණයෙන් යුතු පූජනීය වස්තූන් ද ශිලා ලේඛන, සිරිපතුල් ගල්, තැන් තැන්වල විසිර පවත්නා ලොකු කුඩා ශිලාමය නිර්මාණ, ආදී වසර දෙදහසක අපේ උරුමය සඟවා ගත් වස්තූන් මෙම ස්ථානයේ පවතින බැවින් ඒවා ආරක්ෂා කිරීම අපගේ යුතුකම බව සඳහන් කළ යුතු ය. විහාරස්ථානයකට, ගමකට, ප්‍රදේශයකට, අභිමානයක් හිමි වන්නේ ඒ ඒ ස්ථානවල පවත්නා ඓතිහාසික උරුමයන් ආරක්ෂා කර ගැනීමෙන් පමණි. පසුගිය දශක ගණනාවක් පුරා නිධන් මිත්‍යාවෙන් අන්ධභාවටයට පත් පුද්ගලයන් විසින් මෙම ස්ථානයේ පවත්නා ඓතිහාසිකත්වය විනාශ මුඛයට ඇද දමා ඇත. ඒ අනුව පුරාවිද්‍යාත්මක මෙන් ම ඓතිහාසික වශයෙන් වැදගත්කමක් දරණ මෙම ස්ථානය පිළිබඳ ව කරුණු අනාවරණය කිරීමත් මෙම ස්ථානය ප්‍රතිසංස්කරණය කරමින් අනාගත පරපුර වෙත එම ඓතිහාසිකමය සාධක සුරක්ෂිත කල යුතු බව දැක්විය හැකි ය.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


සුමංගල, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, (1959) ***මහාවංසය*** ප්‍රථම භාගය: ශ්‍රී එස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

හෙට්ටිආරච්චි, කේ, සමරනායක, ජී, අබේනායක, අයි.කේ. (2013), ***ඓතිහාසික චේතියගිරි විහාරය:*** තරංජි ප්‍රින්ටර්ස් නාවින්න, මහරගම.

paranavithana.S.(1983) ***Inscription of Ceylon, vol.2, part 1***, Department of Archaeology, Colombo.

Dias, Malini, (1991)s ***Epigraphical Notes***, Archaeological survey of Ceylon.